


අපි හැමෝම උත්සහා කරන්නේ මේ ජීවිතේ ප්‍රශ්න අඩු කරගෙන ජීවත් වෙන්න.“කවදාවත් නොවිදිමි දුක්“ කතාව සමාජයේ නොයෙක් පැතිකඩ ඔස්සේ ගලාගෙන යනවා.දුක,සතුට,සෙනෙහස,ආදරය,කරුණාව මේ සෑම දෙයක්ම ඇතුලත් වෙලා ගොඩ නැගුනු කතාවෙ මෙතෙක් ඔබ කියවපු පැතිකඩෙන් එහාට දෙයක් පස්වන කොටසෙන් දකීවි.මා ඔබට යමක් පවසන්නම්.ඔබට මා මේ කතාව ලබාදෙන්නේ මගෙ ඇගිලිතුඩුවලින් යතුරු පුවරුවේ තද කරන හැම බොත්තමකටම මගේ ඇස්වලින් වැටෙන කදුලුත් එකතු කරමින්.ඒ නිසා කතාව ගැන දොස්,අදහස්,සුභ පැතුම් එක් කරමින් ලින්ක් එක යටින් ඔබ තබායන ප්‍රතිචාරය මට ගොඩක් වටිනවා.කතාව ඉදිරියට ගෙනියන්න මට ශක්තියක් වෙනවා එය.මා ඉල්ලන්නෙ මේ සොදුරු නවාතැන්පලේ සියලුම රචකයින් වෙනුවෙන් එයයි.ඔබට ජය...

# <u>05</u>

**<u>පෙර දින මතකයෙන්....</u>**

‘‘සොරි පුණ්‍යා.හැමෝම හිතන් ඉන්නෙ මමයි ඔයයි යාලුයි කියලා.ඉතිං හැමෝම මගෙන් පාටි ඉල්ලනවා‘‘

‘‘මොකක්...අපි දෙන්න යාලුයි????ඒ මොකක්ද අනේ ඒ කතාව.‘‘

‘‘කවුද දෙයියනේ දන්නෙ..මුංගෙ කතානෙ ඕවා‘‘

‘‘හ්ම්....ආ තනුක.‘‘

පුණ්‍යා රුපියල් පන්සීයක් මට දික් කරා..

‘‘මොකද පුණ්‍යා මේ..ඇයි සල්ලි‘‘

‘‘මේකෙන් යාලුවන්ට කන්න අරන් දෙන්න..‘‘

‘‘ඔයාට පිස්සුද අනේ.අපි දෙන්න අතර මෙයාල කියනව වගෙ සම්බන්ධයක් නෑනේ.ඇයි මෙහෙම වියදම් කරන්නෙ.‘‘

‘‘ඒක ඉතිං කට්ටිය පිලි ගන්නෑනෙ තනුක.ඔයා ඕකෙන් යාලුවන්ට කන්න අරන් දෙන්නකො ඉතිං.මං සතුටින් දෙන එකනෙ.ම්...‘‘

‘‘අනේ මන්ද පුණ්‍යා ඔයත්...‘‘

*********************************************************

මම පුණ්‍යාගෙන් ගත්ත සල්ලිත් අරගෙන කැන්ටිමට ගිහින් යාලුවන්ට කන්න අරන් දුන්නා.තව දුන්නොත් තවත් කයි මුං ගානක්වත් නැතුව.මට ඕන උනේ පුලුවන් තරම් අඩුවෙන් වියදම් කරන්න.ඒ ලෝභ කමකට නෙමෙයි.පුණ්‍යාට ඉතුරු සල්ලි ටික දෙන්න ඕන නිසා.

‘‘තනුකයා...උඹ මොකුත් කන්නෙ නැද්ද?‘‘

මුදිත මගෙන් ඇහුවෙ කටේ මාලු පාන් කෑල්ලක් ඔබා ගන්න ගමන්.

‘‘යකෝ මට කන්න දෙයක් ඉතුරු වෙලා තියෙනවෑ උඹල තියෙන හැම දෙයක්ම කටේ ඔබා ගන්න කොට.පව් අර අහිංසක කෙල්ල.‘‘

‘‘සමාවෙයන් තනුකයා.අපි මචං සීරියස් හිතුවෙ නෑ කිසිම දෙයක්.‘‘

මුදිත ටිකක් අවුල් උනා කියල තේරුනා මට.

‘‘ඒකට අවුලක් නෑ බං..මට දුක පුණ්‍යාගෙ සල්ලි වලින් උඹලට මේ විදියට සලකන්න වෙච්ච එක.මගෙ සල්ලි වියදම් කරානම් මට අවුලක් නෑ බං.‘‘

‘‘ඉතිං බං උඹල දැන් සෙට්නෙ.උඹ වියදම් කරත් එකයි.පුණ්‍යා වියදම් කරත් එකයි.‘‘

සයුර විහිලුවෙන් වගෙ කිව්වෙ මට.

‘‘නෑ සයුර එහෙම කිසිම සම්බන්ධයක් මගෙයි පුණ්‍යාගෙයි නෑ.අපි යාලුවො විතරයි.මං හිතුවා පුණ්‍යාත් එක්ක මම ඉන්නකොට උඹලා ඔහොම හිතයි කියලා..‘‘

‘‘අඩේ...අපි හැමෝම සිරාවටම හිතුවෙ උඹලගෙ ලව් එකක් තියෙනවා කියලා.......අනේ බං සොරි..‘‘

සයුර හැමෝම ඉස්සරහා මගෙන් සමාව ඉල්ලුවා.

‘‘හරි හරි බං. දැං ඒක ඉවරයිනේ.අදින් පස්සෙවත් හරි විදියට හිතපල්ලකො...‘‘

‘‘හැබැයි තනුක උඹයි පුණ්‍යායි සෙට් උනත් ඒකෙ වැරැද්දක් නෑ...උඹල නියමෙට ගැලපෙනවා...‘‘

යන්තම් වැඩේ ශේප් වෙනකොටම මුදිත ආයෙමත් කතාව ඇදල ගත්තා.

‘‘අනේ බං මං උඹලට වදින්නම් ඔය කතාව නතර කරපල්ලකෝ.දැං යමන්ලා පන්තියට.තවත් උඹලා මෙතන හිටියොත් මට වෙන්නෙ හෙට ඉදන් ඇන්ටිත් එක්ක තේ උනු කරන්ඩ‘‘

විනාඩි පහක් දහයක් ඉස්කෝලෙ වටේ රවුමක් ගහලා අපි පන්තියට ආවා.ගෑනු ලමයි ටික නම් හෝ ගාලා කතාව.අනේ මංදා මෙයාලගෙ කතාව කවදා ඉවර වෙයිද කියලා.කට රිදෙන්නෙ නැද්ද දන් නෑ ඔහොම කියවලා.ඒකටත් එක්ක කොල්ලො ටික.කොයි වෙලේ බැලුවත් සොමියේ.

උසස් පෙල සංගීත අංශයෙන් ඉගෙන ගන්න අයයි,චිත්‍ර කරන අයයි ඉන්නෙ අපේ පන්තියෙ හින්දා සින්දුවෙන් කවියෙන් නම් අඩුවක් තිබුනෙම නෑ.ඇයි ඉතිං ලේබල් ගැහුවෙ නැති උනාට සේරම කලාකාරයොනෙ.ඒ අතරෙ මම බැලුවෙ පුණ්‍යා කොහෙද කියලා..පුණ්‍යා පේන්නවත් නෑ...හිතට පුංචි චකිතයක් ආවත් තව ටිකකින් පුණ්‍යා එයි කියල හිතාගෙන මම අපේ කොල්ලො සිංදු කියන තැනට ගියා.

සිංදු පොට් එකේ විශාරද තමයි මුදිත.මුදිත කරන්නෙ චිත්‍ර වුනත් මිනිහට ලස්සනට සිංදු කියන්න පුලුවන්.අනිත් අයත් වටේ ඉදගෙන සපොට් කරනවා.මමත් මුදිත ලගට ගිහින් හීනියට වගේ සිංදුවකට සහයෝගය දුන්නා

‘‘මලට බඹරෙකු සේ.....සිතට ඔබ එනවා......කිරන සේ හිරුගේ...හද සිනා සෙනවා.....ඔබ සිනාසෙනවා....‘‘

අපි සිංදු කියන අතරෙ පුණ්‍යා පන්තියට ඇවිත් ඉදගත්තා.කට්ටිය සිංදු කිව්වට ඕනවට එපාවට කියනවා වගෙ මට තේරුනේ.මම හිතුව දේ හරි කියල ඔප්පු වුනා සයුර මැද්දට පැනල සිංදුව නැවැත්තුවම.

‘‘හෝව් හෝව් හෝව්...නවත්තපල්ල ඔය ඇඩියාව....මොකක්ද බං මේ මගුලෙ තේරුම..පරණ රෙකෝඩින්නෙ බං මේ කියන්නෙ.ලැජ්ජයිනෙ බං මියුසික් ක්ලාස් එකේ උං මේව කියනකොට..‘‘

‘‘ඉතිං ඔච්චර කියනවන එකේ උඹම කියපන්කො සිංදුවක් පන්ඩිත ටෝක් නොදමා..‘‘

මුදිත තරහෙන් වගෙ කිව්වා.

‘‘යකෝ අපි චිත්‍ර කරන උන්.මේකේ තව ඉන්නවා සංගීත කරන උන් ටිකක්.ඇයි ඉතිං උන්ට චාන්ස් එකක් දෙන්නැත්තෙ.‘‘

සයුර කිව්ව කතාවට හැමෝම බැලුවෙ මගෙ දිහා.මේකනම් පුදුම කරුමයක් තමයි.

‘‘අඩෙ සයුරයා අපිට ඒක පොඩ්ඩක්වත් නෝට් උනේ නැනෙ.අපෙ සෙට් එකේ මියුසික් කරන උනුත් ඉන්නවනෙ...හරි මචං තනුකයා....කියපන් සින්දුවක්‘‘

මුදිත මගෙ පැත්තට හැරිල කිව්වා

‘‘පිස්සුද බං..මට බෑ....‘‘

එහෙම කියනකොට පුණ්‍යා මගෙ දිහා බලාගෙන ඉදලා අහක බලා ගන්නවා දැක්කා මම.

‘‘මොකක්ද බං.උබ නිකම් ගෑනු ලමයා වෙන්න හදනවනේ..අනික බං අපි උබේ වොයිස් එක අහල නැනේ...‘‘

‘‘හරි මචං සයුරයා එහෙනම් කියමුකෝ…‘‘

මට ඕන වුනේ පුණ්‍යාව සතුටු කරන්න.මම එහෙම කිව්ව ගමන් පුණ්‍යා ආයෙමත් මගෙ දිහා බැලුවේ මූනෙ ලස්සන හිනාවක් මතු කරගෙන.ඒ ගැම්මෙන්ම මං ආත්මා ලියනගේ ගායකයා කියන ජනප්‍රිය සිංදුවක් පටන් ගත්තා.

‘‘පෙනෙන නොපෙනෙන දුරක ඉදන්…නුබ ඇවිත් හිත ලගට හොරෙන්….

ආවාට නොකියාම ජීවිතෙන්…නවතින්න හිතුවාද ආයෙමත් ආදරෙන්….

දකින හිම්වෙන හීනේ නුබ කොතැන හිටියා….මතක සැමරුම් අතරේ ජීවිතේ තිබුනා…

හඩන හිනැහෙන නෙත් නුබේ උරහිසේ තිබුනා…ඇත්තමයි නුබ අහසක් වගේමයි හිතුනා…

මිරිගුවක හිත තියලා නුබ දුරක ඇදුනා…රංචු ගැහෙනා රැනේ තනිකමක් දැනුනා…

ඇසිල්ලක දුටු හීනෙන් හිත හුගක් රිදුනා…අරුත නොදකින සෙනෙහේ ඔය නමත් රැදුනා…‘‘

මම ගොඩක් හැගීමෙන් සිංදුව කියනකොට අනිත් පංතිවල ලමයිනුත් අපේ පංතිය වටේ එකතු වුනා.පුනායාත් ඩෙස් එක ලග ඉදන් ගොඩක් ආසාවෙන් මගේ ඇස් දෙක දිහා බලාගෙන සිංදුව රසවින්දා.පුණ්‍යාගෙ ඇස්වලින් මට මොකක් හරි කියනවා වගේ දැනුනෙ මට.ඒත්…….

කොහොම හරි සිංදුව අවසන් කරන පද පේලි ටික ගායනා කරන කොට මම දැක්කෙ පන්තිය වටේ හිටපු ලමයි ටික බයවෙලා වගේ දුවනවා..මගෙ සිංදුවෙ තාලෙට අත්පුඩි ගැහුව කොල්ලො ටික,ඩෙස් එකට තලපු මුදිතයා,සයුරුවා හැමෝම තප්පර ගානකින් සද්දයක්වත් නැතිවුනා..මම කියපු විදියට මුන්ට සින්දුව අවුල් ගියාවත්ද? නැත්තම් මගෙ කටින් වැරදි වචනයක්වත් එලියට පැන්නද? එක දිගට මගේ හිතට ප්‍රශ්න මතුවෙද්දි මම මුදියගෙන් මොකද කියලා අහන්න කට අරින කොටම මගේ පිටිපස්සෙන් ගොරෝසු කට හඩක් ඇහුන මට.

''ආ....පැදුරු සාජ්ජයක් වගේ''

ලාවට පිටිපස්ස හැරිලා බලනකොට දැක්ක දෙයින් එක පාරටම මම ගැස්සිලා නැගිට්ටුනා..එහෙම නැතුව තිබුනනම් තමා පුදුමේ...සුදු පාට කලිසමකුයි කෝට් එකකුයි ඇඳගෙන කළු පාට මූන රවාගෙන අතේ අඩි එක හමාරක් විතර දිග වේවැලත් තියාගෙන මගෙ ලග හිටගෙන ඉන්නෙ ප්‍රින්සිපල්නෙ..

''තමුසෙලා මෙතන කෑ ගහනකොට පොඩි පන්තිවල ලමයි ඉගෙන ගන්නෙ කොහොමද?ඈ..''

ප්‍රින්සිපල් සර් සද්දෙට කියන ගමන් මගෙ පැත්තට හැරුනා.

''මොකක්ද තමුසෙගෙ නම?''

''ත..ත.තත්...තනුක''

බය දෙගුණ තෙගුන වෙලා මගෙ ඇගෙන් හීන් දාඩිය දාලා.මට හිතුනා පන්තිභාර මැඩම් මගෙ නම අහලා මට කැගැහුව වගේ ප්‍රින්සිපල් සර් මට දෙහි කපයි කියලා...

''සංගීත වෙන්න ඇති කරන්නෙ...තමුන්ට ඔච්චර සිංදු කියන්න උවමනාව තියෙන එකේ ඇයි මේ ඩෙස් වලට තට්ටු දදා සිංදු කියන්නෙ.ලබන සතියෙ රැස්වීමෙ සිංදුවක් කියන්න ලෑස්ති වෙලා එන්ඩ..අනිත් පන්ති වලට බාධා වෙන විදියට හැසිරෙන්ඩ එපා...''

ප්‍රින්සිපල් සර් එහෙම කියලා කාර්යාලය පැත්තට ගියා.

සර් ගෙ කතාවනම් බොහොම ෂෝක්.තඩි වේවැලෙන් පස්සට දෙකක් දුන්නනම් කමක් නෑ මේ වගෙ කට්ටක් දෙන්නැතුව..දැන් ඉතිං ලබන සතියෙ කියන්ඩ එපැයි සින්දුවක්.

''එළ මචං එළ...මං නම් හිතුවෙ උබට අද සුපිරියටම කන්ඩ වෙයි කියලා.සර්ටත් හිතට අල්ලලා උබෙ සිංදුව.නේද මුදියො.ආ...''

ලහිරු මගෙ කරට අත දාන ගමන් කිව්වා.

‘‘නැතුව යකෝ ආත්මා පරාදයිනෙ උඹේ වොයිස් එකට..උඹ සිංදුව කියනකොට මට දැනුනෙ මෙතනට ආත්මා ඇවිත් කියලා.එළ මචං...‘‘

මුදිතයගෙ සතුට ඉහ වහා ගිහින්...

‘‘උඹල මේ මගුලක් කියවනවා...මං මේ රත් වෙලා ඉන්නෙ රැස්වීමෙ සිංදුවක් කියන්නෙ කොහොමද කියලා...‘‘

‘‘හරි බං තනුකයා..අපි ඉන්නවනෙ හෙල්ප් එකට..මූ හිතං ඉන්නෙ ලොක්කා සිංදු කියන්න කිව්වෙ මූට විතරයි කියලා..නෑ යකෝ...ලොක්ක අපිට නොකියා කිව්වෙ එන්ඩ කියලා..නැද්ද මුදියෝ‘‘

‘‘ඒකනෙ බං සයුර.මූ හදන්නෙ තනියම බුදුවෙන්න..අපිත් එදාට ස්ටේජ් නැගල හොද අඩව්වක් අල්ලනවා..‘‘

****************************************************************

‘‘තනුක........‘‘

පුණ්‍යාගෙ කට හඩින් මම ගැස්සුනා.පුණ්‍යාගෙ ලගට ගිහින් මම ඉදගත්තෙ ගොඩක් ආසාවෙන්...

‘‘ඇයි පුණ්‍යා..‘‘

‘‘තනුක ඔයා ගොඩක් ලස්සනට සින්ග් කරා..මම ගොඩක් ආසාවෙන් තනුක බලන් හිටියෙ...ඇත්තටම ඔයාගෙ වොයිස් එක ආත්මගෙ වගේ..‘‘

‘‘ඔන්න ඔන්න ඉතිං බොරු කියනවා.ආසාවෙන් බලං හිටියා කියලනම් මට පෙනුනා..ඇගට මොකක්ද උනා එහෙම බලද්දි..‘‘

‘‘මොකක්ද මොකක්ද.............ඕකනම් හොද ලෙඩක් නෙමෙයි තනුක..ඉක්මන්ටම අඩු කරගන්න වෙයි ලමයෝ..‘‘

පුණ්‍යා හිනාවෙන ගමන් කිව්වා..

‘‘හැබැයි බේත් නම් තියෙනව මේකට...ඒත් ඉතිං බොන්න බයයි‘‘

මට එහෙම කිවුව නෙමෙයි කියවුනා..

‘‘යනවා යන්ඩ මෝඩයා...එන පොට නම් හරි නෑ ඔයා...‘‘

*****************************************************




COMMENT ME - www.tharuvideostudio@gmail.com